**බණ්ඩාරවෙල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 11 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 19 දිනද, නගරාධිපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අක්කර 54 රූඩ් 01 පර් 13.58 ක් වූ ඉඩම් කැබලි 50 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | සියළුම වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | තක්සේරු කිරිමට කටයුතු කරමින් පවතින බව හා ඉදිරියේදි එම වටිනාකම 2020 ගිණුම් වලට ගැලපීමට කටයුතු කරමි. |
| (ii) | සභාවට අයත් ගලි බවුසරයක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයත් රථවාහන 06 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදි ගැලපීමට කටයුතු කරමි. |

**(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රු.11,076,130 ක්වූ ටෙන්ඩර් ඇප තැන්පතු, රු.15,220,915 ක් වූ ආදායම් වෙනුවෙන් තැන්පත් හා රු.1,566,455 ක් වූ කොන්ත්‍රාත් තැන්පතු වලට අදාල විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | තැන්පත් ලේඛනය ක්‍රමවත්ව පවත්වාගත යුතු අතර, ගිණුම් සමඟ නිවැරදි උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | තැන්පත් ලේඛනයේ පිටපතක් එවා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාවට අයත් ගලි බවුසරය ලබාගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් මුලා ප්‍රකාශන වල ගෙවිය යුතු ණය ලෙසට දක්වා තිබුණු, රු.1,040,000 ක ණය ශේෂය සනාථ කරන ලියකියවිලිද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ණය ශේෂය සනාථ කරන ලියකියවිලිද ඉදිරිපත් කළයුතුවේ. | මුලා ප්‍රකාශන වලට එම ණය ශේෂය ණය ලේඛනයෙන් ලබාගෙන ඇත. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| xxiv පරිච්ඡේදයේ 4 වන වගන්තිය | සේවය හැර ගිය නිලධාරින් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,006,234 ක හා විශ්‍රාම ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 251,249 ක ණය ශේෂ අය කරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකරගත යුතුවේ. | සියළුම ණය ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂය තුලදී සිදුවූ වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා හා පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | එක් වාහනයක් සම්බන්ධයෙන් නඩු කටයුතු පවතින බව හා අනෙත් වාහනය සම්බන්ධයෙන් ලැබී ඇති අවසන් වාර්තාව අනුව කටයුතු කර ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 396 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06 ඉක්මවූ ගෙවීම සඳහා ඉදිරිපත් නොකල | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක් ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.26,083 ක චෙක්පත් 12 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | | |
| (iii) | මුදල් රෙගුලාසි 571 | වසර 02 ඉක්මවූ විවිධ ඉදිකිරීම් 10 ක අතරුදවුම් රු.558,757 ක් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | වවුචර්පත් පරීක්ෂාව මඟින් ගෙවීම් හඳුනාගෙන පොදු තැන්පත් ගිණුමෙන් කපා හැරීමට කටයුතු කරමින් පවතින බව හා පසුගිය වර්ෂවල තැන්පත් තවදුරටත් පරික්ෂාකර ගැලපීමට කටයුතු කරමි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | සභාවට අයත් දේපල වර්ෂ 05 කට වරක්වත් තක්සේරු කළ යුතු වුවද, කඩ කාමර 770 ක් තක්සේරු නොකර කුලී අයකර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | විධිමත් තක්සේරුවක් කර කුලී අය කිරීමට කටයුතු කරමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.81,593,369 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.60,974,078 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්ත-මේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 24,947,000 | 31,297,352 | 20,036,759 | 11,260,593 | 23,235,000 | 27,138,140 | 26,003,881 | 1,134,259 |
| ii | කුලී | 31,439,000 | 42,118,242 | 29,487,998 | 12,630,244 | 30,162,000 | 48,900,730 | 40,360,002 | 8,540,728 |
| iii | බලපත්‍ර ගාස්තු | 9,265,000 | 8,915,655 | 8,915,655 | - | 8,314,000 | 9,812,705 | 9,812,705 | - |
| iv | වෙනත් ආදායම් | 229,133,000 | 11,908,357 | 208,035,652 | - | 28,991,000 | 51,701,653 | 40,783,444 | 10,918,209 |
| | එකතුව | 294,784,000 | 94,239,606 | 266,476,064 | 23,890,837 | 90,702,000 | 137,553,228 | 116,960,032 | 20,593,196 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසරකට අධික කාලක සිට පැවත එන හිඟහිටි වරිපනම් රු.11,705,360 ක් හා හිඟහිටි වෙනත් ආදායම් රු.127,232,756 ක් අය කරගෙන නොතිබුණි. | හිඟහිටි ආදායම් අය කරගත යුතුවේ. | මේ වනවිට හිඟ වරිපනම් කොටසක් අය කරගෙන ඇති බව හා ඉතිරි හිඟ මුදල් අය කර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බව. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ උසාවි දඩ රු.1,083,558 ක් සහ හිඟ මුද්දර ගාස්තු රු.11,010,300 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අයකරගත යුතුවේ. | මෙම මුදල් නිරවුල් කරන ලෙසට දන්වා යවා ඇත. |

**2.2.4 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය නොකල මුළු හිඟ වරිපනම් හා බදු ආදායම රු.19,682,211 ක් විය. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | මේවනවිට හිඟ වරිපනම් කොටසක් අය කරගෙන ඇති බව හා ඉතිරි හිඟ මුදල් අය කර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරමි. |

**2.2.5 කුලී ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේනිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය නොකල මුළු හිඟ කුලී ආදායම රු.29,183,800 ක් විය. | හිඟ කුලී ආදායම් අයකරගත යුතුවේ. | මේ වනවිට හිඟ කුලී මුදලින් කොටසක් අය කරගෙන ඇති බව හා ඉතිරි හිඟ මුදල් අය කර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

මහ නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද පොදු මංමාවත් වැඩිදියුණු කිරීම හා අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් අදාල ක්‍රියාකාරකම් එහි ඇතුලත් කර නොතිබුණි. | විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට විස්තරාත්මක තොරතුරු ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරන බව. |

### (ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතින්ගේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 පිළිබඳව දැනුවත්වී තිබුණද සභාවට අදාල කරගත හැකි වන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක දර්ශක හඳුනාගෙන ඒ අනුව කටයුතු කරමින් පවති. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාණිජ මධ්‍යස්ථානයේ හා නිදහස් වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 06 ක් කුලියට දීමේදී ගිවිසුම් වලට එළඹ නොතිබුණි. | කඩ කාමර කුලියට දීමේදී ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුවේ. | අදාල ලිපිගොනු පරීක්ෂා කර ගිවිසුම් වලට එළඹෙන බව. |
| (ආ) | පොදු වැසිකිලිය පවත්වාගෙන ගිය බදුකරුගෙන් අයවිය යුතු රු. 255,667 ක හිඟ බදු මුදල් අය කරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අය කරගත යුතුවේ. | බදුකරුගේ තැන්පත් මුදල හිඟ මුදලට හිලව් කිරීමට කටයුතු කරමින් පවති. |
| (ඇ) | තොග විෂයයන් 12 ක රු.37,144 ක ඌනතාවයක් සහ තොග විෂයයන් 9 ක රු.43,985 ක අතිරික්තයක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මනා තොග පාලනයක් පවත්වාගත යුතුවේ. | ඉදිරි වර්ෂයේදි ගැලපීමට කටයුතු කරමි. |
| (ඈ) | වසර දෙකකට වැඩි කාලයක සිට චලනය නොවී ගබඩාවේ රඳවාගෙන තිබෙන රු.238,156 ක් වටිනා වාහන අමතර කොටස්, ජල උපාංග හා විදුලි උපාංග විෂයයන් 18 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවශ්‍යතාවය හඳුනා ගෙන මිලදීගැනීම් සිදුකළ යුතුවේ. | හදිසි අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය උපකරණ ගබඩාවේ තබා ගැනීම අත්‍යාවශ්‍ය බව. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------------- | -------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 05 කට අදාලව සේවක අතිරික්ත 09 ක් සහ තනතුරු 22 කට අදාලව පුරප්පාඩු 68 ක් පැවතුනි. | කාර්ය මණ්ඩලය විධිමත් කරගත යුතුවේ. | අතිරික්ත තනතුරු අනුමත කරගැනීමට කටයුතු කරමින් පවති. පුරප්පාඩු සඳහා ඌව පළාත් ප්‍රධාන ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇති බව හා නාගරික කොමසාරිස් වරයා පත්වීම් බලධරයා වන පත්වීම් ලබාදීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත. |
| (ආ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 7 ඡේදය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවසරය නොලබා සෞඛ්‍ය හා වෙනත් කම්කරුවන් 17 දෙනෙකු බඳවාගෙන රු.549,474 ක වැටුප් ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. | අනුමත කාර්ය මණ්ඩලය තුල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) ගේ අනුමැතිය ලැබී ඇත. |

### 3.4 නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------------------- | -------------------- | ------------------------ |
| සභාවට අයත් භාවිතයෙන් ඉවත්කර ඇති වාහන 21 ක් පැවතුනි. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | සේවයක් ලබාගත නොහැකි තත්ත්වයේ වාහන පමණක් අලුත්වැඩියා වලට යොමුකර නොමැති බව. |

### 3.5. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------------------------- | ------------------------- | -------------------------- |
| සමාලෝචිත වර්ෂයට අදාලව සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා අනුව වටිනාකම සඳහන් නොකළ භාණ්ඩ විෂයයන් 10 කට අදාලව භාණ්ඩ ඒකක 505 ක ඌනතාවයක් පැවති අතර, ඉන්වෙන්ට්‍රිගත නොකල විෂයයන් 27 කට අදාල භාණ්ඩ ඒකක 219 ක් පැවතුනි. | ඌනතා හා අතිරික්ත සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව, ගිණුම සකස් කිරීමෙන් පසුව ලද බැවින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර නොමැත. ඉදිරි වර්ෂයේදී ගැලපීමට කටයුතු කරමි. |

## 4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

### 4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොමැත. |